මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - 48
2020-04-11 ප.ව 04.40 ට

# විදේශ මුදල් තැන්පත් කිරීමට නව බැංකු ගිණුමක්.

- මුදල් තැන්පත් කිරීමට පාර්ශව ගණනාවකට අවසර ...
- වැඩිපුර පොලියක් ...
- බදු හා විදේශ විනිමය නිදහස ...

රට තුළ සහ රටින් බැහැර වෙසෙන සියලු ශ්‍රී ලාංකිකයනට ස්වකීය විදේශ මුදල් ඉපැයීම්, ඉතිරි කිරීම් සහ ආයෝජන ශ්‍රී ලංකාවේ තමන් කැමති බැංකුවක තැන්පත් කිරීම සඳහා නව බැංකු ගිණුමක් දැන් හඳුන්වාදී තිබේ. එය විශේෂ තැන්පතු ගිණුම ලෙස නම් කර ඇත. නව ගිණුම කාලීන හෙවත් ස්ථාවර තැන්පතු විශේෂයකි.

රට තුළ සහ රටින් බැහැර වෙසෙන ශ්‍රී ලාංකිකයනට මෙන්ම ද්විත්ව පුරවැසියනට, සෙසු රාජ්‍යයන්හි වෙසෙන ශ්‍රී ලංකා සම්භවයක් සහිත පුද්ගලයනට, ශ්‍රී ලංකාවෙන් බැහැර අන්‍ය ජාතිකයනට ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාපිත හෝ ලියාපදිංචි අරමුදල්, ව්‍යාපාරික ආයතන සහ සමිගම්වලට සහ ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන අන් ඕනෑම කෙනකුට තමන් තෝරාගන්නා බැංකුවක විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට පිළිවන.

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය විසින් අප්‍රේල් 08 වැනිදා රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කර ඇති නිවේදනයෙහි නව තැන්පතුවට අදාළ රෙගුලාසි ඇතුළත් කොට තිබේ. ශ්‍රී ලංකාවෙන් බැහැර විදේශ මුදල් තැන්පතු හෝ ආයෝජන පවත්වාගෙන යන සමස්ත ශ්‍රී ලාංකික ව්‍යාපාර ප්‍රජාවට, සමාගම් හිමිකරුවනට මෙන්ම ශ්‍රී ලංකාවේ සුබසිද්ධිය පතන සියලුදෙනාට සිය බැංකුවලට උපදෙස් දීමෙන් තමන් සතු අරමුදල් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කළ හැකි බව එහි සඳහන් වේ.

නව ගිණුමෙහි තැන්පත් කළ හැකි මුදල් ප්‍රමාණයට අවම සීමාවක් නැත. තැන්පතුවක අවම කාලය මාස 06කි. සාමාන්‍ය විදේශ මුදල් තැන්පතුවකට ගෙවන පොලියට වැඩි පොලී අනුපාතයක් තැන්පතුව කල්පිරීමේදී ගෙවනු ලැබේ. ඒ අනුව මාස 06ක විශේෂ තැන්පතු ගිණුමකට 1% ක සහ මාස 12 තැන්පතුවකට 2% ක වැඩිපුර පොලියක් හිමි වේ. තැන්පතුව කල්පිරුණු විට එහි ඇති මුදල් බාධාවකින් තොරව වෙනත් මුදලකට පරිවර්තනය කිරීමටත්, ශ්‍රී ලංකාවෙන් බැහැර ගෙන යාමටත් අවසර ඇත.

සියලු තැන්පතු බදුවලින් සහ විදේශ විනිමය රෙගුලාසිවලින් නිදහස් කෙරේ. තැන්පතුවලට බැංකු රහස්‍ය විධිවිධාන යටතේ ආරක්ෂාව ඇත. ගිණුම් හිමියනට ලැබෙන වැඩිදුර ප්‍රතිලාභ සහ ඊට අදාළ නෛතික ප්‍රතිපාදන 2020 අය වැය ලේඛනයෙන් හඳුන්වාදෙනු ලැබේ.

ඇමරිකානු ඩොලර්, යූරෝ, ස්ටර්ලින් පවුම්, *ඕස්ට්‍රේලියානු ඩොලර්,* සිංගප්පූරු ඩොලර්, ස්වීඩන් ක්‍රෝනර්, ස්විට්සර්ලන්ත ෆ්‍රැන්ක්, කැනඩා ඩොලර්, හොංකොං ඩොලර්, ජපාන යෙන්, ඩෙන්මාර්ක් ක්‍රෝනර්, නෝර්වේජියානු ක්‍රෝනර්, චීන රෙන්මින්බි සහ නවසීලන්ත ඩොලර් විශේෂ ගිණුමට භාරගන්නා මුදල් වර්ග වෙයි.

විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳ වැඩිදුර විස්තර ජනාධිපති කාර්යාලයේ, මුදල් අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ ශ්‍රීලංකාවේ විදේශ දූත කාර්යාලවල වෙබ් අඩවි ඔස්සේ ලබා ගැනීමට පිළිවන. COVID 19 නිවාරණ සහ සමාජ සංරක්ෂණ ප්‍රවේශයට පිටිවහලක් වනු පිණිස මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නැයි ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන සියලු ශ්‍රී ලාංකිකයනට ආරාධනා කෙරේ.

මොහාන් සමරනායක
අධ්‍යක්ෂ ජනරාල්
ජනාධිපති මාධ්‍ය අංශය
2020-04-11